සියලු හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2021
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation - 2021

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / மணித்தியாலம் / Hours: 01 |

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. පහත සඳහන් රාග අතරින් වැඩිම විකෘති ස්වර සංඛ්‍යාවක් යෙදෙන රාගය කුමක්ද ?
   1. බිලාවල්
   2. කාෆි
   3. භෛරවි
   4. යමන්

02. රි ග ම ධ නි ස්වර 5 ම විවාදි ස්වර වශයෙන් යොදා ගන්නා රාගය කුමක්ද ?
   1. කාෆි
   2. බිලාවල්
   3. යමන්
   4. භෛරවි

03. රාත්‍රී ප්‍රථම ප්‍රහරය තුළ ගැයෙන නිර්දේශිත රාග යුගලයකි.
   1. යමන් - කාෆි
   2. භූපාලි - යමන්
   3. කාෆි - බිලාවල්
   4. භූපාලි - භෛරවි

04. ම ග රි̣ / ස රි නි / ස - ධ̣ / නි̣ ස - / මෙම ස්වර පාදය අයත් වන සර්ගමයට අදාළ රාගය කුමක්ද?
   1. බිලාවල්
   2. භෛරවි
   3. කාෆි
   4. යමන්

05. රාගයක විස්තර පිළිබඳව දැන ගැනීමට උපකාරී වනුයේ,
   1. මධ්‍යලය ගීත
   2. සර්ගම් ගීත
   3. ලක්ෂණ ගීත
   4. තානාලංකාර

06. "කවාලා විළඳ ජාති , කවුරුදෝ අර කවුළුවෙන් " යන සරළ ගීතයන්හි තනු නිර්මාණය සඳහා යොදා ගත් රාග වනුයේ,
   1. භෛරවි
   2. කාෆි
   3. යමන්
   4. භූපාලි

07. සර්ගම් ප්‍රබන්ධ විශේෂය සඳහා අදාළ නොවන කරුණු තෝරන්න.
   1. ස්වර පමණක් යොදා ගැනීම
   2. රාග සංගති යොදා ගෙන තිබීම
   3. රාග ලක්ෂණ විස්තර කිරීම
   4. තාලානුකූලව නිර්මාණය වී තිබීම

08. ස්වර ලිපියක /ප - ම ග / % / යනුවෙන් යෙදී ඇති විට දෙවන විභාගය සඳහා යෙදී ඇති සංකේතයෙන් කියවෙන්නේ,

1. පෙර විභාගයේ ඇති ස්වර ඛණ්ඩ නැවත වාදනය කළ යුතු බවයි.
2. පෙර විභාගය තුන් වරක් වාදනය කළ යුතු බවයි.
3. පෙර විභාගය සිව් වරක් වාදනය කළ යුතු බවයි.
4. එම විභාගය නිශ්ශබ්දව සිටිය යුතු බවයි.

09. කෙහෙර්වා හා ත්‍රිතාලයට සමාන බටහිර තාලය වන්නේ,

1. 4/4
2. 3/4
3. 6/8
4. 5/8

10. බටහිර සංගීතයට අනුව " මපධනි ස්රිංම්" යන ස්වර වලට අදාල ස්කේලය හඳුන්වනුයේ,

1. C Major Scale යනුවෙනි.
2. C Minor Scale යනුවෙනි.
3. F Major Scale යනුවෙනි.
4. F Minor Scale යනුවෙනි.

11. ග්‍රැමෆෝන් තැටි ගී වර්ගයට අයත් වන ගී පාදය තෝරන්න.

1. සිනිඳු සුදු මුදු තලාවේ
2. රත්න දීප ජන්ම භූමි
3. වදිමු සුගත ශාක්‍ය සිංහ
4. සිරි බුද්ධගයා විහාරේ

12. ග්‍රැමෆෝන් ස්වායින තැටි යුගයේ ප්‍රබල සංගීතඥයෙකි.

1. මොහොමඩ් ගවුස්
2. විශ්වනාත් ලාවුජි
3. ආනන්ද සමරකෝන්
4. බී.එස්. පෙරේරා

13. ශ්‍රී ලංකා ගුවන් විදුලියේ පටිගත කළ මුල්ම සරළ ගිය වන්නේ,

1. සුවඳ රෝස මල් නෙලා
2. අක්කෙ අක්කෙ අර බලන්නකෝ
3. කරුණා නදියේ පැන නාමු
4. ඕලු පිපිලා විල ලෙල දෙනවා

14. සරළ ගීතයක බහුල වශයෙන් දක්නට ලැබෙන ආකෘතිය පිළිවෙලින් සඳහන්ව ඇති වරණය තෝරන්න.

1. අන්තරා , පෙර වාදනය. අතුරු වාදනය, ස්ථායි
2. ස්ථායි, අන්තරා, පෙර වාදන, අතුරු වාදන
3. අතුරු වාදනය, ස්ථායි, අන්තරා, පෙර වාදනය
4. පෙර වාදනය, ස්ථායි, අතුරු වාදනය, අන්තරා

15. බෙම්ටො තාලයට අනුව ගායනය කළ හැකි ගීතයකි.

1. සිනහවෙන් හෝ කථාවෙන් බෑ
2. ලංකා ලංකා පෙම්බර ලංකා
3. රත්න දීප ජන්ම භූමි
4. හෙළ ජාතික අභිමානේ

16. සැළලිහිණි සන්දේශයේ බෙහෝ පද්‍ය ප්‍රබන්ධ වී ඇත්තේ,

1. සමුද්‍රඝෝෂ වෘත්තය.
2. දොළොස්මත් වෘත්තය.
3. දස අටමත් වෘත්තය.
4. සූවිසි මත් වෘත්තය.

17. අනාගතාත්මකවත්මකව ගැයෙන ගී පාදයකි.
1. තෙල් ගාලා හිස පීරන් නැතෝ
2. මේ කාගේදෝ කමතා
3. බෝගම්බර අපි නුවරට යනකොට
4. වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනී.

18. සේ ගීයක් හා ගැමි ගීයක් ලෙස පිළිවෙලින් ඇත්තේ කිනම් වරණය තුළද?
1. සාර සදිසි පෙති පේර නෙලන කල - රුගත් සුරා පිරූ මිනිස්
2. පැහැ සරණිය මිණි පැමිණිය - රූ රුසේ අදිනා ලෙසේ
3. සඳවා සුදු වැලි පිවිතුරු - තෙල් ගාලා හිස පීරන් නැතෝ
4. වරමති සුභ වරිතේ - මන්මත් කරවන දන මුළු දෙරණා

19. නාඩගම් හා නූර්ති සම්ප්‍රදායයන් සඳහා යොදා ගනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩ යුගලය දැක්වෙන වරණය කුමක් ද?
1. මද්දලය - තබ්ලාව
2. මද්දලය - පක්වාජය
3. තබ්ලාව - මද්දලය
4. දවුල හා උඩැක්කිය

20. "ප්‍රේමයෙන් මන රංජිත වේ තන්දිත වේ." හා "ආලෙ බැන්ද මාගෙ රම්‍ය වන්" යන ගීත ඇතුළත් නාට්‍ය යුගලය පිළිවෙලින් සඳහන් වරණය කුමක්ද?
1. මනමේ - සිංහබාහු
2. සිංහබාහු - කාලගෝල
3. මනමේ - කාලගෝල
4. කාලගෝල - මනමේ

- ප්‍රශ්න අංක 21 සිට 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තාල අක්ෂර සටහන යොදා ගන්න.

  / තිං නා තිං නා / ති ට ති ට / තිං තිං නා නා / තු නා තු නා

21. ඉහත තබ්ලා අක්ෂර සියල්ල නිකුත් කළ හැක්කේ,
1. දායාවෙන් පමණි.
2. බායාවෙන් පමණි.
3. දායාවෙන් හා බායාවෙන් පමණි.
4. බායාවෙන් හා දායාවෙන් වෙන් වෙන් වශයෙන් වැයීමෙනි.

22. ඉහත සටහනෙහි තාල අක්ෂර සටහන් කර ඇත්තේ,
1. ත්‍රිතාලයට අනුරූපවය.
2. කෙහෙර්වා තාලයට අනුරූපවය.
3. දීප්වන්දි තාලයට අනුරූපවය.
4. ජප්තාලයට අනුරූපවය.

23. ඉහත සඳහන් රිද්ම රටාවට අනුරූප වන දේශීය තිත් රූපය තෝරන්න.
1. මහ තනි තිත
2. සුළු මැදුම් දෙතිත
3. මැදුම් මහ දෙතිත
4. මැදුම් තනි තිත

- අංක 24 සිට 26 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගීත උපයෝගී කර ගන්න.

  a) දැතට වළළු
  b) තව තව කට මැත දොඩවා
  c) ළප නොමවන් සඳ සේ
  d) මේ අවුරුදු කාලේ

24. ශ්‍රද්ධාතෝ ගීත නාට්‍යයේ ඇතුළත් ගීතයට අයත් අක්ෂරය වන්නේ,

1. a
2. b
3. c
4. d

25. සී.ද.එස්. කුලතිලක මහතාගේ ගීත නිර්මාණයකි.

1. a
2. b
3. c
4. d

26. මනමේ නාට්‍යයේ ඇතුළත් ගීතයට අදාළ අක්ෂරය වන්නේ,

1. a
2. b
3. c
4. d

27. ගොයම් දා මහුල, මාර පරාජය, ආදී සංධ්වනි නිර්මාණය කළ සංගීතඥයා වනුයේ,

1. සී.ද.එස්. කුලතිලක මයා
2. රෝහණ බැද්දගේ මයා
3. ඩබ්.බී. මකුලොළුව මයා
4. ආනන්ද සමරකෝන් මයා

28. තාරතාවය, විපුලතාවය හා ධ්වනි ගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණයන් අතරින් විපුලතාවය හැඳින්වීම සඳහා භාවිත තවත් නාමයක් වන්නේ,

1. උච්ච භේදයයි
2. ජාති භේදයයි
3. රූප භේදයයි.
4. නාද ප්‍රභේදයයි

29. නාදයේ ත්‍රිවිධ ගුණ විද්‍යාවේදී හඳුන්වනුයේ,

1. ධ්වනි ගුණය - තරංග - සංඛ්‍යාතය වශයෙනි.
2. තාරතාවය - කම්පනය - තරංග වශයෙනි.
3. විපුලතාවය - තාරතාවය - ධ්වනි ගුණය වශයෙනි.
4. කම්පනය - විපුලතාවය - සංඛ්‍යාතය වශයෙනි.

30. "බෛජු බව්රා" චිත්‍රපටයේ ගැයෙන "තූ ගංගාකි මෞජ මෛ" ගීතය නිර්මාණය වී ඇති රාගය කුමක්ද?

1. බිලාවල් රාගය
2. කාෆි රාගය
3. භෛරවි රාගය
4. යමන් රාගය

31. පහත දැක්වෙන්නේ මව්පිය ගුණ ඇතුළත් ගීත ලැයිස්තුවකි.

a. සොම්නස හෝ සන්තාපය හමුවේ
b. අන්දරයාගේ වැව් තාවල්ලේ
c. අම්මා සඳකි මම ඒ ලොව
d. ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩිනා

මෙම ගීත අතරින් මව් ගුණ පිළිබඳව කියවෙන ගීත ඇතුළත් වරණය තෝරන්න.

1. A සහ B
2. B සහ C
3. A සහ D
4. B සහ D

32. ජප් තාලයෙහි "තිනා" යන අවනද්ධාකාර සහිත විභාගයට අයත් තාල සංකේතය කුමක්ද?

1. X
2. O
3. 2
4. 3

33. "යමිඳු පාමුල පිදෙන අයුරින්" යන ගී පාදයේ මාත්‍රා බෙදෙන ආකාරය අනුව ඊට අදාළ තාලය වන්නේ,

1. ත්‍රිතාලය
2. ජප් තාලය
3. දූදරා තාලය
4. දීප්චන්ද තාලය

34. විෂමග්‍රහයෙන් ගැයීමට සුදුසුම ගීතය තෝරන්න.

1. සුවඳ පත්ම ඕලු ආදී
2. ඇසේ මධුර ජීවනයේ ගීතා
3. දුර පෙනෙන තැනිතලා
4. දී කිරි දී කිරි ගෙනාව දී කිරි

35. Sound forge, Adobe Audition, Acid Pro, යන මෘදුකාංග යොදා ගත හැකි වන්නේ,

1. අන්තර්ජාලයෙන් සංගීතය පිළිබඳව විෂය කරුණු සොයාගැනීමටය.
2. MIDI ඇතුළත් සංගීත කොටස් නිර්මාණය කර ගැනීමටය.
3. විද්‍යුත් විශ්වකෝෂ ඇසුරෙන් සංගීතය පිළිබඳව තොරතුරු සොයා ගැනීමටය.
4. ගායනය, වාදනය, ඇතුළත් ගීතයක් පටිගත කර ගැනීමටය.

36. "සඳ සාවි මා, මේ අවුරුදු කාලේ" යන ගීත නිර්මාණය කරන ලද සංගීතඥයා වනුයේ,

1. රෝහණ බැද්දගේ මහතා
2. ලයනල් රන්වල මහතා
3. සී.ද.එස්. කුලතිලක මහතා
4. ලයනල් අල්ගම මහතා

37. මධුර ජවනිකා, ගජමන් පුවත, ජසයා හා ලෙන්චිනා යන නාට්‍ය සඳහා සංගීතය සැපයූ දේශීය සංගීතඥයෙකි.

1. සී.ද.එස්. කුලතිලක මහතා
2. රෝහණ බැද්දගේ මහතා
3. ලයනල් රන්වල මහතා
4. ලයනල් අල්ගම මහතා

38. භාරතීය සුප්‍රසිද්ධ තබ්ලා වාදන ශිල්පියෙකි.

1. ජග් ජිත් සිං
2. හරි ප්‍රසාද් චෞරසියා
3. ෂකීර් හුසේන්
4. රවි ශංකර්

39. සිතාර් වාදනය හා බටනලා වාදනය සඳහා ලෝ ප්‍රකට වාද්‍ය ශිල්පීන් දෙදෙනෙකි. පිළිවෙලින්,

1. හරි ප්‍රසාද් චෞරසියා - රවි ශංකර්
2. රවි ශංකර් - හරි ප්‍රසාද් චෞරසියා
3. ජග් ජිත් සිං - රවි ශංකර්
4. රවි ශංකර් - ජග් ජිත් සිං

40. ගසල් ගායනයේ රජු ලෙස විරුදාවලි ලත් සංගීතඥයෙකි.

1. රවි ශංකර්
2. ඒ.ආර්. රහුමාන්
3. ජග් ජිත් සිං
4. හරි ප්‍රසාද් චෞරසියා

All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂය / பாடம் / Subject | පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper | ii | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

- සැලකිය යුතුයි.

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. i. භෛරවි රාගයට අදාළ ස්වර සංගතියක් ලියන්න.(ල.01)

ii. තිව්‍ර මධ්‍යමය යෙදෙන නිර්දේශිත රාගය කුමක්ද? (ල.01)

iii. 7/8 තාල පෙන්වන මෙම සංකේතයට අදාල හින්දුස්ථානි තාලයනම් කරන්න. (ල.01)

iv. "හරි ප්‍රසාද් චෞරසියා" ප්‍රසිද්ධ වී ඇත්තේ කුමන සංගීත භාණ්ඩයක් සඳහා ද (ල.01)

v. පරිගණකය ඇසුරෙන් සංගීතය නිර්මාණය කිරීමේදී භාවිත කළ හැකි මෘදුකාංගයක් නම් කරන්න. (ල.01)

vi. F Major Chord එකට අයත් ස්වර ලියන්න.(ල.01)

vii. උත්තර භාරතීය ප්‍රධාන තත් වාද්‍ය භාණ්ඩය ...................... වන අතර එය වාදනය කරන්නේ ................ යෙනි (ල.02)

viii. විපුලතාවය, ධ්වනි ගුණය හා ...................... නාදයේ ත්‍රිවිධ ගුණ වේ. (ල.01)

ix. දුර පෙනෙන නැනිතලා ගීතය ....................... ග්‍රහයෙන් ගැයෙන අතර එම ගීතය .................... අයත් ගීයකි. (ල.02)

x. ...................... ග්‍රන්ථය ඩබ්ලිව්.බී. මකුලොළුව මහතා අතින් නිර්මාණය කර දායාද කරන ලදි. (ල.01)

02. i. පහත දැක්වෙන වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා හිස්තැන් වලට අදාළ පිළිතුරු සපයන්න.

| රාගය | මේලය | වාදී | සංවාදී | ආරෝහණ | අවරෝහණ | රාගයට අයත් ස්වර සංගතිය |
|---|---|---|---|---|---|---|
| ................ | භෛරවි | ම | .......... | .................... | ස් නි ධ ප ම ග රි ස | ............. ... |
| යමන් | ................. | ....... | නි | ස රි ග ම/ප ධ නි ස් | ........................... | ................. |

$(ල.\frac{1}{2} \times 8 = 04)$

ii. ඉහත වගුවේ සඳහන් රාග දෙකෙන් ඔබ කැමති රාගය නම් කර එයට අයත් මධ්‍යාලය ගීතයක / ලක්ෂණ ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.04)

iii. ඔබ ප්‍රස්ථාර කළ ගීතයට වාදිතයට අයත් තාලය නම් කර නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ල.04)

03. පහත රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




i. ඉහත ස්වර පුවරුව අනුව අංක 01 සිට 08 දක්වා අංකනය කර ඇති ස්වර මොනවාද (ල.08)

ii. එම ස්වර අෂ්ටකය අයත් (Scale) ස්කේලය නම් කරන්න. (ල.02)

iii. 2/4/6 අංක වලට අයත් ස්වර එකවර වාදනය කිරීමේ දී එය අයත් Chord එක නම් කරන්න. (ල.02)

04. අම්මාපල්ල බඹරුන්ගේ අත වරද නැති / රූ රුසේ අදිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා යන ගීත ඇසෙන විට අපේ කම අපට දැනේ. පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| A | B | C | D |
| --- | --- | --- | --- |
| ගැල් ගී<br>පැල් ගී<br>i. ........................ | ශාන්තිකර්ම ගී<br><br>ii. ........................ | දරු නැළවිලි ගී<br><br>iii. .................... | ප්‍රශස්ති ගී<br><br>iv. ..................... |

i. A/B/C/D තීරු වල ඇතුළත් කරුණු අනුව නම් කළ හැක්කේ කුමන ගී වර්ග ලෙසද?

A ........................................

B ........................................

C .......................................

D ....................................... (ල.04)

ii. වගුව තුළ ඇති රෝම ඉලක්කම් සඳහා නිදසුන් සපයන්න. (ල.04)

iii. ගැමි ගීයේ හා සේ ගී යේ විශේෂ ලක්ෂණ දෙක බැගින් පිළිවෙලින් සඳහන් කරන්න. (ල.02)

iv. ආඝාතාත්මක හා අනාඝාතාත්මකව ගැයෙන ගී පාදය බැගින් ලියා දක්වන්න. (ල.02)

05. i.තබ්ලාවේ දළ රූප සටහනක් ඇඳ කොටස් 04 ක් නම් කරන්න.

ii.




ඉහත ප්‍රස්තාරයේ A B C D කොටස් නම් කරන්න. (ල.04)

iii. දායන් හා බායන් භාවිතා කර වයන අක්ෂර දෙකක් හා දායන් පමණක් භාවිතා කර වයන අක්ෂර දෙකක් නම් කරන්න. (ල.04)

06. i."එන්ඩද මැණිකේ මමත් දියඹටා......" යනු ග්‍රැමර්ෆෝන් ගීතයකි. එම ගීත ආරම්භය පිළිබඳ හා ග්‍රැමෆෝනය පිළිබඳව ඔබ දන්නා කරුණු 04 ක් ලියන්න.(ල.04)

ii. මුල්ම ගුවන් විදුලි සරල ගීතයේ නිර්මාතෘවරයා නම් කරන්න. (ල.02)

iii. කපිරිඤ්ඤා සංගීතයේ ලක්ෂණ 04 ලියන්න. (ල.04)

iv. එම ශෛලිය ඇසුරින් නිර්මාණය වූ ගීත 04 ක් නම් කරන්න. (ල.04)

07.

- ග්‍රන්ථකරණයෙන් හා විවිධ නිර්මාණයන්ගෙන් හෙළ සංගීතයට සිදු වූ සේවාවන් ඉමහත්ය.

i. එක් එක් අය ඉදිරියෙන් සිදු වූ සේවා එක බැගින් සඳහන් කරන්න.

- ඩබ්ලිව්.බී. මකුලොළුව ගුරුන් ..............................................
- සී. ද ඇස් කුලතිලක ගුරුන් ..............................................
- ලයනල් රංවල ගුරුන් ..............................................
- රෝහණ බැද්දගගේ ගුරුන් ..............................................

(ල.04)

ii. මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නව නාට්‍ය දෙකක් නම් කර ඊට අදාළ ගී පද දෙකක් ලියන්න. (ල.04)

iii. වෙනත් නව නාට්‍ය 04 ලියන්න. (ල.04)

පෙරදිග සංගීතය

10 ශ්‍රේණිය - තෙවන වාරය

පළමු පත්‍රය සඳහා පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 4 | 21. 1 | 31. 3 |
| 2. 4 | 12. 2 | 22. 1 | 32. 2 |
| 3. 2 | 13. 4 | 23. 1 | 33. 4 |
| 4. 2 | 14. 4 | 24. 2 | 34. 3 |
| 5. 3 | 15. 3 | 25. 1 | 35. 4 |
| 6. 1 | 16. 1 | 26. 3 | 36. 2 |
| 7. 3 | 17. 4 | 27. 3 | 37. 2 |
| 8. 1 | 18. 3 | 28. 3 | 38. 3 |
| 9. 1 | 19. 1 | 29. 3 | 39. 2 |
| 10. 3 | 20. 3 | 30. 3 | 40. 2 |

(ලකුණු 1 x 40 = 40 )